**සියළුම ජාතික පාසල්, අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩල වෙත අධ්‍යාපන ලේකම් විසින් කරනු ලබන නිවේදනයයි.**

තම නිත්‍ය සේවා ස්ථානයේ සිට වෙනත් සේවා ස්ථාන වෙත තාවකාලික අනුයුක්ත ලබා, එම අනුයුක්ත කාල සීමාවන් අවසන් කළ සියළුම අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් නැවත අධ්‍යයන කටයුතු සඳහා සිය නිත්‍ය සේවා ස්ථාන විවෘත කරන තෙක් එම අනුයුක්ත සේවා ස්ථානයෙහිම, අනුයුක්ත කාලය දීර්ඝ කලා සේ සලකා කටයුතු කළයුතු වේ. නැවත අධ්‍යයන කටයුතු සඳහා නිත්‍ය සේවා ස්ථාන විවෘත කළ පසු ඔවුන් එම සේවා ස්ථාන වෙත සේවයට වාර්තා කළ යුතු අතර, තවදුරටත් අනුයුක්තය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය නම්, නිත්‍ය සේවා ස්ථානයෙහි ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා නොවන) වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වේ. එසේ නිත්‍ය සේවා ස්ථානයෙහි ආයතන ප්‍රධානියාගේ නිර්දේශ නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සලකා බලනු නොලැබේ.

02. තවද පවත්නා කොවිඩ් උවදුරු තත්ත්වය හමුවේ රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රජය විසින් වරින්වර නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන විධිවිධානයන්ට යටත්ව, ආයතනයන්හි පවත්නා අත්‍යාවශ්‍ය කටයුතු සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශවලට යටත්ව සේවකයින් සේවයට කැඳවීමේ බලය අදාළ ආයතන ප්‍රධානීන් සතුවේ.

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
''ඉසුරුපාය''
පැලවත්ත,
බත්තරමුල්ල